# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1981 අංක 56 දරන රත්නපුර දිස්ත්‍රික්කයේ ශුභසාධක අරමුදල (භාරකාර මණ්ඩලය) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1081 සැප්තැම්බර් මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් විශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 45 යි    තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 56 දරන රත්නපුර දිස්ත්‍රික්කයේ ශුභසාධක අරමුදල (භාරකාර මණ්ඩලය) පනත

[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 09 වන දින]

එල්. ඩී.—ඕ. 97/80

**රත්නපුර දිස්ත්‍රික්කයේ ශුභසාධක අරමුදලේ භාරකාර මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

රත්නපුර දිස්ත්‍රික්කයේ ශුභසාධක අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක්, ඒ අරමුදලේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම උදෙසා මුදල් ප්‍රතිපාදනය කිරීම සඳහා, මේ දක්වා රත්නපුරේ පිහිටුවා ඇති හෙයින් ද: — දේශිකාව.

එකී අරමුදලේ කටයුතු සහ පරමාර්ථ භාරකාර මණ්ඩලයක් විසින් මේ දක්වා ඉටු කරනු ලැබ ක්‍රියාත්මක කරනු ලැබ ඇති හෙයින් ද:

සංස්ථාගත කරන ලෙස එකී භාරකාර මණ්ඩලය විසින් ඉල්ලුම් කර ඇති හෙයින් හා එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත සඳහා සුවඟුල් වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1981 අංක 56 දරන රත්නපුර දිස්ත්‍රික්කයේ ශුභසාධක අරමුදල (භාරකාර මණ්ඩලය) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — **ලුහුඬු නාමය.**

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) රත්නපුර දිස්ත්‍රික්කයේ ශුභසාධක අරමුදලේ භාරකාර මණ්ඩලයේ තත් කාලයේ සාමාජිකයන්, අවිච්ඡින්න පැවැත්මක් සහිතව "රත්නපුර දිස්ත්‍රික්කයේ ශුභසාධක අරමුදලේ භාරකාර මණ්ඩලය" යන නාමයෙන් (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු ය. එකී නාමයෙන් ඒ මණ්ඩලය විසින් නඩු පැවරීම සහ මණ්ඩලයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය. තව ද මණ්ඩලය විසින් පොදු මුද්‍රාවක් තබා ගැනීම හා පාවිච්චි කිරීම කරනු ලැබිය හැකි අතර තම අභිමතය පරිදි එය වෙනස් කිරීම ද කළ හැකි ය. — **රත්නපුර දිස්ත්‍රික්කයේ ශුභසාධක අරමුදලේ භාරකාර මණ්ඩලය සංස්ථාගත කිරීම.**

3. (1) අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය මණ්ඩලය වෙත පැවරෙන අතර ඒ මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:— — **මණ්ඩලය සංස්ථාපනය කිරීම සහ වෙනත් කරුණු.**

(අ) රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ දිසා අමාත්‍යවරයා; ඔහු මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය;

(ආ) රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා; ඔහු මණ්ඩලයේ ලේකම්වරයා විය යුතු ය;

(ඇ) රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ දිසා අමාත්‍යවරයා විසින් නම් කළ යුතු තැනැත්තන් දෙදෙනෙක්;

(ඈ) රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයා;

(ඉ) රත්නපුර සහකාර සමාජ සේවා අධ්‍යක්ෂවරයා;

2—ජ 52180—11,375 (80/10)

(ඊ) රත්නපුර සහකාර පළාත් පාලන අධ්‍යක්ෂවරයා ;

(උ) රත්නපුර දිසාපති කාර්යාලයේ ගණකාධිකාරිවරයා; ඔහු මණ්ඩලයේ භාණ්ඩාගාරිකවරයා විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ නම් කරන ලද මණ්ඩලයේ එක් එක් සාමාජිකයා, එසේ නම් කරන ලද දින සිට, අවුරුදු දෙකක කාලයක් ධුරය දැරිය යුතු අතර තම ධුර කාලය අවසානයේ දී නැවත නම් කරනු ලැබීමට ද ඔහු සුදුසු වන්නේ ය.

(3) මණ්ඩලයේ රැස්වීම් යටත් පිරිසෙයින් සෑම සය මසකට වරක් වත් පැවැත්විය යුතු ය. ලේකම්වරයා විසින් එවැනි සෑම රැස්වීමක්ම පිළිබඳව සම්පූර්ණ දින පහක ලිඛිත දැන්වීමක් සාමාජිකයන්ට දිය යුතු ය:

එසේ වුව ද, මණ්ඩලය රැස්විය යුතු යයි ලේකම්වරයා අදහස් කළහොත්, ඕනෑම වේලාවක, සම්පූර්ණ දින තුනක ලිඛිත දැන්වීමක් දී, මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවීමට ලේකම්වරයාට බලය ඇත්තේ ය.

(4) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු ය.

අරමුදල සමන්විත විය යුතු ආකාරය.

4. අරමුදල—

(අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින අරමුදලේ බැරට පැවති සියලුම මුදල්වලින්; සහ

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් පසු අරමුදලට එකතු වන සියලු මුදල්වලින්

සමන්විත විය යුතු ය.

අරමුදලට අයත් මුදල් යෙදවිය හැක්කේ කවර කාර්ය සඳහා ද යන වග.

5. අරමුදලට අයත් මුදල් මණ්ඩලය තීරණය කරන ආකාරයකින්—

(අ) බෞද්ධ සාසනික කටයුතුවල ප්‍රගතිය සැලසීම සඳහා;

(ආ) සියලු ආගම් අතර සුහදතාව සහ සමගිය වර්ධනය කිරීම අරමුණු කොට ගෙන හින්දු, මුස්ලිම්, ක්‍රිස්තියානි සහ සෙසු ආගමික සංවිධානවල කටයුතුවලට සහායවීම සඳහා;

(ඇ) ළමා පරපුරේ පොදු ශුභසාධනයේ ප්‍රගතිය ඇති කිරීම සඳහා;

(ඈ) රත්නපුර දිස්ත්‍රික්කයේ ජාතික කලා ශිල්ප වැඩිදියුණු කිරීමට සහ නගා සිටුවීමට ප්‍රමුඛස්ථානය දෙමින් ජාතික කලා ශිල්ප වැඩිදියුණු කිරීම සහ නගා සිටුවීම සඳහා;

(ඉ) ක්‍රීඩා කටයුතු වැඩිදියුණු කිරීම සඳහා;

(ඊ) රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ යහපත හෝ හිත පිණිස ඉවහල් වේ යයි මණ්ඩලය අදහස් කරන වෙනත් යම් කාර්යයක් සඳහා

යෙදවීම මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

6. (1) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය, හිතකර හෝ ආනුෂංගික සියලු දේ කිරීම සඳහා මණ්ඩලයට බලය ඇත්තේ ය. මණ්ඩලයේ බලතල, කාර්ය සහ කරතව්‍ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, මණ්ඩලය විසින් පහත සඳහන් බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ හැකි ය :—

(අ) අරමුදල් ඇති කිරීම හෝ, මුදලින් නැතහොත් ද්‍රව්‍යවලින් ආධාර ලබා ගැනීම හෝ ත්‍යාග ලබා ගැනීම හෝ ප්‍රදානයන් ලබා ගැනීම ;

(ආ) යම් නිශ්චල හෝ චංචල දේපළක් කවර හෝ ආකාරයකින් අත් කර ගැනීම හා දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඇ) අරමුදල පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් සේවයේ යෙදවීම, සේවා නියුක්ත කිරීම හා ඔවුනට පාරිශ්‍රමික ගෙවීම ; සහ

(ඈ) අරමුදලට අයත් මුදල් මණ්ඩලය තීරණය කරන යම් ආයෝජනවල ආයෝජනය කිරීම.

7. මණ්ඩලය විසින්, අරමුදලේ ගිණුම් පහත සඳහන් බැංකුවලින් කවර හෝ බැංකුවක පවත්වාගෙන යා යුතු ය :— බැංකු ගිණුම්.

(අ) රත්නපුරේ, ලංකා බැංකුව ; හෝ

(ආ) රත්නපුරේ, මහජන බැංකුව.

8. මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් පහත දැක්වෙන සියලුම කරුණු සම්බන්ධයෙන් හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ රීති සාදනු ලැබිය හැකි ය :— රීති.

(අ) මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු පවත්වා ගෙන යාම ;

(ආ) මණ්ඩලයේ සාමාජිකයන්ගේ සහ මණ්ඩලයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ බලතල, පැවැත්ම, කාර්ය සහ කර්තව්‍ය ; සහ

(ඇ) අරමුදලේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, එහි මුදල්වල භාරකාරත්වය සහ එහි ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය කිරීම සහ එහි මුද්‍රාව තැබීම.